# වාර්ෂික වාර්තාව
# வருடாந்த அறிக்கை
# ANNUAL REPORT

# 2020







අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතිඥාන මණ්ඩලය
இலங்கை ஒத்தியல்பு மதிப்பீட்டிற்கான தராதர அங்கீகார சபை
Sri Lanka Accreditation Board for Conformity Assessment

SLAB
SRI LANKA ACCREDITATION BOARD

වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය
வர்த்தக, வணிக மற்றும் உணவு பாதுகாப்பு அமைச்சு
**Ministry of Trade, Commerce and Food Security**

වාර්ෂික වාර්තාව

**2020**

අනුකූලතා තක්සේරු පිළිබඳ

ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය

වෙළෙඳ වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය

පටුන


| | පිටු අංකය |
|---|---|
| සභාපතිගේ පණිවිඩය | II |
| අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරීගේ සංශිප්තය | III |
| 1. හැඳින්වීම | 1 |
| 1.1. තත්ත්ව ප්‍රතිපත්තය, අපක්ෂපාතීත්ව ප්‍රතිපත්තය, දැක්ම, මෙහෙවර සහ වටිනාකම් | 2 - 4 |
| 1.2. ඉලක්ක, අරමුණු සහ උපාය මාර්ග | 5 - 6 |
| 1.3. ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ කාර්යයන් | 7 |
| 2. පාලක සභාව | 8 |
| 3. ව්‍යවස්ථාපිත කමිටු | 10 |
| 3.1. විගණන ගමිටුව | 10 |
| 4. මෙහෙයුම් කළමණාකරණය | 11 |
| 4.1. මානව සම්පත | 11 |
| 4.2. කාර්යමණ්ඩලය | 11 |
| 5. කාර්යසාධන විශේෂතා 2020 | 12 |
| 5.1. ප්‍රතීතන සේවා | 12 |
| 5.2. පුහුණු වැඩසටහන් | 12 |
| 5.3. අන්තර්ජාතික කටයතුවලට සහභාගීවීම | 12 |
| 6. මූල්‍ය තොරතුරු 2020 | 13 |
| 6.1. මූල්‍ය විශේෂ අවස්ථා | 13 |
| 6.2. 2020 දෙසැම්බර් 31 වන දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය | 14 |
| 6.3. 2020 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වසර සඳහා මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශය | 17 |
| 6.4. 2020 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වසර සඳහා ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය | 19 |
| 6.5. 2020 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වසර සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 21 |
| 6.6. මූල්‍ය ප්‍රකාශනයේ සටහන් | 23 |
| ඇමිණුම් | |
| ඇමිණුම 01 - සංවිධාන සටහන | 50 |
| ඇමිණුම 02 - ක්‍රියාකාරීත්ව ව්‍යූහය 2020 | 51 |
| ඇමිණුම 03 - 2020 දෙසැම්බර් මස 31 වන දිනට සේවක තොරතුරු | 52 |
| ඇමිණුම 04 - සේවක පුහුණුව 2020 | 54 |
| ඇමිණුම 05 - පවත්වනලද පුහුණු වැඩසටහන් | 56 |

# සභාපතිගේ පණිවිඩය

ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ 2020 වාර්ෂික වාර්තාව සඳහා මෙම පණිවිඩය ලබා දෙන්නේ ඉමහත් සතුටිනි. මෙම වසර තුළදී ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ ප්‍රධාන කාර්යභාරයන් වන ප්‍රතීතනය පිළිබඳව ප්‍රධාන පාර්ශව කරුවන්, කර්මාන්ත, රජයේ ප්‍රතිපත්ති සැලසුම්කරුවන්, නියාමන අධිකාරීන්, විශ්වවිද්‍යාල ප්‍රජාව, පරීක්ෂණ සහ සංවර්ධන ආයතන, අනුකූලතා සහ තක්සේරු කිරීමේ ආයතන, (පරීක්ෂණ විද්‍යාගාර, පරීක්ෂණ ආයතන, සහතික කිරීමේ ආයතන, වලංගු කිරීමේ හා සත්‍යාපන ආයතන) සඳහා කැපී පෙනෙන දායකත්වයක් ලබාදීමට ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයට හැකි විය. කොවිඩ් වසංගතය මගින් ඇති කරන ලද අභියෝග හමුවේ වුවද, තොරතුරු තාක්ෂණය යොදා ගනිමින් දුරස්ථ තක්සේරු ක්‍රියාත්මක කිරීම, පුහුණු වැඩසටහන් මාර්ගගත ක්‍රමයට ක්‍රියාත්මක කිරීම, ආයතනයේ සියලුම රැස්වීම් ZOOM තාක්ෂණය ඔස්සේ නියමිත වෙලාවට පවත්වා අදාල තීරණ ගැනීම ආදිය ක්‍රියාත්මක කිරීම නිසා ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය 2020 වසරේදී වඩාත් උසස් මෙහෙයුම් ප්‍රතිපල ලබා ගැනීමට සමත් විය.

2020 වසරේදී ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩල පනත යාවත්කාලීන කිරීම සඳහා අලුතින් එක් කළ යුතු ප්‍රතිපාදන හඳුනා ගැනීමට කටයුතු කරන ලදී. අන්තර්ජාතික වෙළඳාම තුළින් මතු වන නව අනුකූලතා තක්සේරු අවශ්‍යතාවන් හඳුනා ගැනීමත්, කාර්මාන්ත සඳහා අවශ්‍ය වන නව පරීක්ෂණ අවශ්‍යතාවන්, පර්යේෂණ හා සංවර්ධන අවශ්‍යතාවන් හඳුනාගෙන, නව වෙළඳපල අවශ්‍යතාවන් සපුරාලිය හැකි වන පරිදි පනතට නව සංශෝධන එකතු කිරීම කාලීන අවශ්‍යතාවයක් ලෙස සලකා එහි මූලික අදියර 2020 වසරේදී ආරම්භ කිරීමට ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයට හැකි විය. මේ සඳහා අවශ්‍ය අදහස් හා යෝජනා ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ ප්‍රධාන පාර්ශවකරුවන් සමග (වාණිජ මණ්ඩල, තක්සේරුකරුවන්, ප්‍රතීතන ක්ෂේත්‍රයේ විද්වතුන් හා සේවා ලාභීන්) සමග මාර්ගගත සාකච්ඡා පවත්වා අදාළ තොරතුරු එක්රැස් කිරීම සිදු කරන ලදී.

තවද භාණ්ඩ හා සේවා නියාමනය කිරීමේ වගකීම දරන රජයේ නියාමන ආයතනයක් වන කෘෂිකාර්ම අමාත්‍යාංශයේ ජාතික පොහොර ලේකම් කාර්යාලය, අප අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය, අපනයන සංවර්ධන මණ්ඩලය, මධ්‍යම පරිසර අධිකාරිය වැනි නියාමන ආයතන ප්‍රධානීන් හමු වී ඔවුන්ගේ කාර්යභාරය ඵලදායීව ඉටු කිරීම සඳහා සහ ප්‍රතීතනයේ දායකත්වය ලබා ගන්නේ කෙසේද යන්න පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් ආයතන මට්ටමින් පවත්වන ලදී. ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය ජාතික ප්‍රතීතන ආයතනය ලෙස, තාක්ෂණිකව නිරවද්‍ය, අන්තර් ජාතිකව පිළිගත් පර්යේෂණ වාර්තා, සාධාරණ මිලගණන් යටතේ ලබා ගැනීමට අවස්ථාව උදා කර ඇත.

ශ්‍රී ලංකාවේ ආර්ථික, සමාජයීය හා පාරසරික සංවර්ධනයට සෘජු දායකත්යක් දක්වන ප්‍රතීතන මණ්ඩලයේ අරමුණු ලභාකරගැනීමට ක්‍රියාත්මක වන පාලක සභිකයන්, අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරී, සහ සමස්ත කාර්ය මණ්ඩලය වෙත මගේ ස්තුතිය පිරිනමමි.

**ආචාර්ය සම්පත් වාහල**

සභාපති

ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය

# අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරීගේ සංශිප්තය



2020 වසරේ මාස කිහිපයක්ම කොවිඩ් වසංගත තත්වය නිසා මතු වූ අභියෝග වලට මුහුණ දීමට සිදු වුවත් මෙම වසර තුළ දී ශ්‍රී ලංකා ප්‍රතිකර්ම මණ්ඩලය ට එහි ප්‍රධාන මෙහෙයුම් ක්‍රියාවලිය තුළ සැළකිය යුතු ප්‍රගතියක් ලබා ගැනීමට හැකි විය. කොවිඩ් වසංගතය පැතිරීම වැළැක්වීම සඳහා රජය විසින් රට වසා දැමූ කාලය තුළ කාර්යමණ්ඩලය සඳහා මාර්ගගතව රාජකාරී සිදු කිරීමට අවශ්‍ය පහසුකම් ලබා දීමට ක්‍රියා කරන ලදී. අඛණ්ඩ අන්තර්ජාල පහසුකම් සහ “zoom” තාක්ෂණය ලබා දෙන ලද අතර, කළමනාකරණය විසින් නිරන්තර අධීක්ෂණ කටයුතු සිදු කිරීම මගින් උසස් ප්‍රගතියක් ලබා ගැනීමට ප්‍රතිකර්ම මණ්ඩලයට හැකි විය.

2020 වසරේ ප්‍රතිකර්ම දිනය, “ආහාර සුරක්ෂිතාව සඳහා ප්‍රතිකර්මයෙහි දායකත්වය” යන තේමාව යටතේ ප්‍රධාන පාර්ශවකරුවන් සීමිත පිරිසකගේ සහභාගීත්වයෙන් පැවැත්වීමට ක්‍රියා කරන ලදී. ප්‍රතිකර්ම දින උළලේදී නවීකරණය කරන ලද වෙබ් අඩවිය හඳුන්වා දීම, ආයතනයේ කාර්යයන් ප්‍රවර්ධනය කිරීම සඳහා සකස් කරන ග්‍රන්ථය එළි දැක්වීම, ඊ පුවත් පත්‍රිකාව හඳුන්වා දීම සහ ආහාර සුරක්ෂිතතාව සඳහා ක්‍රියාත්මක වන ප්‍රධාන ආයතන වල දායකත්වයෙන් අන්තර්ජාල සම්මන්ත්‍රණයක් පැවැත්වීමට කටයුතු කරන ලදී.

ප්‍රතිකර්ම තක්සේරු කටයුතු වලට කොවිඩ් වසංගතය නිසා ඇති වූ බලපෑම අවම කර ගැනීම සඳහා APAC ආයතනය මගින් හඳුන්වා දෙන ලද මාර්ගෝපදේශ අනුව දුරස්ථ තක්සේරු ක්‍රමය හඳුන්වා දෙන ලදී. මෙම ක්‍රමය හඳුන්වා දීමේ පළමු පියවර ලෙස, අනුකූලතා තක්සේරු ආයතනවල සමීක්ෂණයක් සිදු කරන ලද අතර, දුරස්ථ තක්සේරු ක්‍රමය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මූලික පහසුකම් එම අනුකූලතා තක්සේරු ආයතන සතුව ඇති බවට තහවුරු කර ගන්නා ලදී. දුරස්ථ තක්සේරු කටයුතු සිදු කිරීම සඳහා තක්සේරුවන් සුදානම් කිරීමෙන් පසුව වසරේ අගභාගයේදී දුරස්ථ තක්සේරු ක්‍රියාත්මක කිරීම ආරම්භ කිරීමට හැකි විය.

මෙම කාර්ය සඳහා අවශ්‍ය වන වීඩියෝ සම්මන්ත්‍රණ පහසුකම්ද තක්සේරුකරුවන් සඳහා ලබා දීමට ක්‍රියා කරන ලදී. තව දුරටත් ආයතනයේ පුහුණු කටයුතු මාර්ගගතව සිදු කිරීම සඳහා සැළසුම් සකස් කරන ලද අතර ඒ සඳහා අවශ්‍ය ස්මාර්ට් පුවරුව වැනි උපකරණ ලබා දීමට කටයුතු කරන ලදී.

තවද ආයතනයේ සියලුම රැස්වීම් (පාලක සභා රැස්වීම්, ප්‍රතිකර්ම කමිටු රැස්වීම්, තාක්ෂණික උපදේශක කමිටු රැස්වීම්) ආදී සියලු රැස්වීම් මාර්ගගත ක්‍රමයට පැවැත්වීමට කටයුතු කරන ලදී. ප්‍රතිකර්ම කටයුතු සඳහා ශ්‍රී ලංකා ප්‍රතිකර්ම මණ්ඩලය උපයාගෙන තිබෙන අන්තර්ජාතික පිළිගැනීම ආරක්ෂා කර ගනිමින් ආයතනයේ සියලු කාර්යභාරයන් ISO 17011:2017 ට (අනුකූලතා තක්සේරු ආයතන, ප්‍රතිකර්මය කරනු ලබන ප්‍රතිකර්ම ආයතනයක් සඳහා තිබිය යුතු අවශ්‍යතාවන්) අනුගත වන අයුරින් ඉටු කිරීමට කටයුතු කරන ලදී.

ජාතික තත්ත්ව යටිතල පහසුකම් ව්‍යුහයේ ප්‍රධාන සාමාජික ආයතනයක් ලෙස 2020 වසර තුළදී අන්තර්ජාතික වෙළඳාම ප්‍රවර්ධනයට සහ භාණ්ඩ හා සේවා භාවිතා කරන්නන්ගේ සෞඛ්‍ය හා ආරක්ෂාව ඇති කිරීම සහ අන්තර්ජාතිකව පිළිගත් ප්‍රතිකර්ම සේවාවන් (පරීක්ෂණාගාර, ක්‍රමංකන විද්‍යාගාර, පරීක්ෂණ කිරීමේ ආයතන, සහතික කිරීමේ ආයතන) ලබා දීමට ශ්‍රී ලංකා ප්‍රතිකර්ම මණ්ඩලය ට හැකියාව ලැබිණි.

ජාතික ප්‍රතිකර්ම ආයතනය ලෙස ශ්‍රී ලංකා ප්‍රතිකර්ම මණ්ඩලය 2020 වසරේදී ශ්‍රී ලංකා ප්‍රතිකර්ම මණ්ඩල පනත සඳහා සංශෝධන හඳුනා ගැනීමට ක්‍රියා කරන ලදී. මෙහි අරමුණ වන්නේ නව වෙළෙඳපොළ ප්‍රවණතා සහ අවශ්‍යතාවලට ගැලපෙන පරිදි පනතට නව ප්‍රතිපාදන එක් කර ගැනීමයි. මේ සඳහා අවශ්‍ය යෝජනා ලබා ගැනීම සඳහා විවිධ පාර්ශවකරුවන් (අනුකූලතා තක්සේරු ආයතන, නියාමන ආයතන, වාණිජ මණ්ඩල, තක්සේරුකරුවන්, තාක්ෂණික විශේෂඥයන්) සමග අන්තර්ජාලය මගින් zoom තාක්ෂණය ඔස්සේ සාකච්ඡා පවත්වන ලදී.

සහස්‍ර සංවර්ධන ඉළක්ක සහ ජාතික ප්‍රතිපත්ති රාමුව තුළ තාක්ෂණික රෙගුලාසි ක්‍රියාත්මක කිරීමේදී, ප්‍රතීතනය කරන ලද ආයතන වලින් මෙම සේවා ලබා ගැනීමේ වැදගත්කම හා ඒ පිළිබඳව අවශ්‍ය මග පෙන්වීම ලබාදීම සඳහා විවිධ නියාමන ආයතනයන් සමග වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

තවද ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ කාර්යමණ්ඩලය හා තක්සේරුකරුවන් සඳහා ධාරිතා සංවර්ධන හා නිපුණතා ප්‍රවර්ධන පුහුණු වැඩසටහන් පැවැත්වීමටද කටයුතු කරන ලදී. 2020 වසර තුලින් සහකාර අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු APAC සම තක්සේරුකරුවන් ලෙස සුදුසුකම් සපුරගන්නා ලදී.

2020 වසර තුළදී එහි ප්‍රධාන ක්‍රියාකාරකම වන ප්‍රතීතන සේවා සැපයීම හා පුහුණු වැඩසටහන් පැවැත්වීම මගින් රුපියල් මිලියන 37.08 ක ආදායමක් ඉපයූ අතර එය මුළු පුනරාවර්තන වියදමින් 72% ක් වේ.

**චන්ද්‍රිකා තිලකරත්න**

අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරී

අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය

# 1. හැඳින්වීම

2005 අංක 32 දරණ පනත මගින් ස්ථාපිත ප්‍රතීතනය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව තුළ කටයුතු කරන එකම අධිකාරී බලය හිමි ආයතනය අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය යි. ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය වෙළෙඳ වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන අතර එය පාලනය කරනු ලබන්නේ පනතේ විධිවිධාන අනුව පත් කරන ලද සාමාජිකයින් දහතුන් දෙනෙකුගෙන් **(13)** සමන්විත පාලක සභාවක් මගිනි. අමාත්‍යවරයා විසින් පාලක සභාවේ එක් සාමාජිකයෙකු සභාපතිවරයා ලෙස පත් කරයි. පාලක සභාවේ ලේකම් වරයා ලෙය අධ්‍යක්ෂවරයා කරටයුතු කරන අතර ඔහු/ ඇය මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධාරියා ද වේ.

දේශීය සහ අපනයන වෙළෙඳපොළ සඳහා භාණ්ඩ හා සේවා සැපයීමේදී අනුකූලතා තක්සේරු කිරීම් පහසු කිරීම සඳහා ප්‍රතීතන ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම සහ අවශ්‍ය ප්‍රතීතන සේවා සැපයීම මණ්ඩලයේ වගකීම වේ. ප්‍රධාන ප්‍රතීතන සේවා අතරට පරීක්ෂණ/ වෛද්‍ය පර්යේෂණ/ ක්‍රමාංකන රසායනාගාර ප්‍රතීතනය**,** පද්ධති/ නිෂ්පාදන සහ පුද්ගලයින් සහතික කිරීමේ ආයතන**,** පරීක්ෂණ ආයතන**,** හරිතාගාර වායු වලංගු කිරීමේ සහ සත්‍යාපන ආයතන**,** නිපුණතා පරීක්ෂණ සේවා සපයන්නන් ඇතුළත් වේ. **2005** අංක **32** දරන අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය පනත අනුව **2005** සැප්තැම්බර් **23** වන දින සිය මෙහෙයුම් ආරම්භ කරන ලදී. **ISO/IEC 17011 (**අනුකූලතා තක්සේරු ආයතන ප්‍රතීතනය කිරීම සඳහා ප්‍රතීතන ආයතන සඳහා අවශ්‍යතා) ජාත්‍යන්තර ප්‍රමිතියට අනුකූලව ජාත්‍යන්තර රසායනාගාර ප්‍රතීතන සහයෝගිතා අන්‍යෝන්‍ය පිළිගැනීමේ එකඟතාවය **(ILAC MRA),** ජාත්‍යන්තර ප්‍රතීතන සංසදය බහු පාර්ශ්වයීය එකඟතාවය **(IAF MLA)** සහ ආසියා පැසිෆික් ප්‍රතීතන සහයෝගීතාව අන්‍යෝන්‍ය පිළිගැනීමේ එකඟතාවය **(APAC MRA)** සඳහා අත්සන් කර ඇති ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය**,** ජාත්‍යන්තරව පිළිගත් ප්‍රතීතන සේවාලාභීන්ට ලබා දෙයි.

## 1.1. තත්ත්ව ප්‍රතිපත්තිය, අපක්ෂපාතීත්ව ප්‍රතිපත්තිය, දැක්ම, මෙහෙවර සහ වටිනාකම්

### තත්ත්ව ප්‍රතිපත්තිය

ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය එහි සේවා ලාභීන්ට උපරිම අවංක භාවයෙන් හා කාර්යක්ෂමතාවයෙන් ප්‍රතීතන සේවා ලබාදීමට බැඳී ඇති සේවා ආයතනයක් විය යුතුය.

ගනුදෙනුකරුවන් හා ඇල්මක් දක්වවන පාර්ශව වල ව්‍යාපාරික පරිසරයේ වෙනස් වන අවශ්‍යතා සැළකිල්ලට ගනිමින් ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය ජාත්‍යන්තර ප්‍රමිති හා ප්‍රතිපත්ති වලට අනුව ප්‍රතීතන සේවා ලබා දීමට බැඳී සිටී.

ජාත්‍යන්තර පිළිගැනීම ප්‍රවර්ධනය කිරීම සඳහා ජාත්‍යන්තර ආයතන සමග ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය ඵලදායී ලෙස කටයුතු කරනු ලබයි.

අනුකූලතා තක්සේරු හා ප්‍රතීතන සේවා සම්බන්ධව පරිසරයේ ඇති ඉල්ලුම හා අවශ්‍යතාවලට අදාල වැඩිදියුණුකිරීම් සඳහා වන වෙනස් කිරීම් වෙනුවෙන් ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය නිරතුරුව එහි ක්‍රියාකාරීත්වය සමාලෝචනයට භාජනය කරනු ලබයි.

## අපක්ෂපාතීත්ව ප්‍රතිපත්තිය

ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ ප්‍රධාන අරමුණු වන්නේ 2005 අංක 32 දරන ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩල පනත යටතේ එය ස්ථාපිත කර ඇති කාර්යය සඳහා ශ්‍රී ලංකා රජය විසින් පවරා ඇති රාජකාරි ඉටු කිරීමයි. ප්‍රතීතනයට අදාළ සමස්ත ප්‍රතිපත්ති සහ උපාය මාර්ග වෙනස් කොට සැලකීමකින් තොරව ස්ථාපිත කර ඇත. ප්‍රතිපත්ති සහ උපාය මාර්ග සැකසීමේ ක්‍රියාවලියේදී සියලුම පාර්ශ්වකරුවන්ගේ සහභාගීත්වය සහතික කර වෙනස් කොට සැලකීමකින් තොරව ක්‍රියාත්මක කිරීමේ වගකීම ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ පාලක සභාව සතු වේ.

ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ පිරිස් සහ කමිටු අපක්ෂපාතීත්වයට බාධා පමුණුවන සහ අභ්‍යන්තරයෙන් බාධා පැමිණියහැකි ඕනෑම ගැටුමක් හෙළිදරව් කළ හැකි අනවශ්‍ය වාණිජ, මූල්‍ය සහ වෙනත් පීඩනයකින් තොරව ස්වාධීනව තම ක්‍රියාකාරකම් සහ කාර්යයන් ඉටු කරන බව සහතික කෙරේ. ප්‍රතීතනයට අදාළ තීරණ ගනු ලබන්නේ ඇගයීම් සිදු කරන අයගෙන් වෙනස් වූ එම ක්ෂේත්‍රයේ නිපුණතාවයක් ඇති පුද්ගලයින් හෝ කමිටු විසිනි.

ප්‍රතීතනය සහ ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම් හැරුණු විට, ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රතීතන අධිකාරිය ලෙස ප්‍රතීතනය සඳහා අයදුම් කිරීමට අදහස් කරන ආයතනවලට ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රතීතන අධිකාරිය වශයෙන් ගත හැකි තීරණවලට බලපෑ හැකි කරුණු සම්බන්ධයෙන් කිසිදු උපදේශන කටයුත්තක් ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය කිසිදු තත්වයක් යටතේ සිදු නොකරනු ඇත.

## දැක්ම, මෙහෙවර සහ වටිනාකම්

**දැක්ම**

“ජාතික ආර්ථිකයට හා සමාජ සුබසාධනයට දායක වෙමින් ක්‍රියාකාරී හා නවෝත්පාදන ප්‍රතීතන ආයතනයක් ලෙස ජාත්‍යන්තර පිළිගැනීමට ලක් කිරීම”

**මෙහෙවර**

“දේශීය හා විදේශීය වෙළඳපොළ සඳහා භාණ්ඩ හා සේවා සැපයීමේදී අනුකූලතා තක්සේරු මගින් ජාත්‍යන්තර පිළිගැනීම පහසු කරවන අයුරින් ප්‍රතීතන සේවා ප්‍රවර්ධනය හා සැපයීම අපි කරන්නෙමු”

**වටිනාකම්**

- **ඍජු හා ඉහළම සදාචාරමය හැසිරීම් රටාවක් තුළ සේවා සැළසීම.**
- **දිගින් දිගට ඉගෙන ගැනීම.**
- **ඇල්මක් ඇති පාර්ශවයන්ගේ විශ්වාසය තහවුරු වන අයුරින් කණ්ඩායමක් ලෙස කටයුතු කිරීම.**
- **ස්වාධීන හා පක්ෂගග්‍රාහී නොවී කටයුතු කිරීම.**

## 1.2. ඉලක්ක, අරමුණු සහ උපාය මාර්ග

| | ප්‍රධාන විෂය පථය | ඉලක්ක / අරමුණු | මූලික අරමුණු | KPI |
|---|---|---|---|---|
| 1. | විවිධ පාර්ශවකරුවන් අතර ප්‍රතිනතය ප්‍රවර්ධනය කිරීම | 1. ප්‍රතිනතය සහ එහි ප්‍රතිලාභ පිළිබඳව පාර්ශ්වකරුවන් දැනුවත් කිරීම | 1. ප්‍රතිපත්ති සම්පාදකයින් සමඟ රැස්වීම්<br>2. පුහුණු වැඩමුළු/වෙබිනාර්<br>3. ජන මාධ්‍ය/වෙබ් අඩවිය/සමාජ මාධ්‍ය භාවිතය තුළින් දැනුවත් කිරීම් | 1. දැනුවත් කරන ලද සංවිධාන/පුද්ගලයින් ගණන<br><br>2. නව ප්‍රතිනතන යෝජනා ක්‍රම පිළිබඳව දැනුවත් කරන ලද කර්මාන්ත/ අනුකූලතා තක්සේරු ආයතන සංඛ්‍යාව |
| | | 2. ශ්‍රී ලංකා ප්‍රතිනතන මණ්ඩලයේ ජාතික තත්ත්ව යටිතල පහසුකම් ව්‍යූහය තුළ ස්ථානගත කිරීම | 1. යෝජිත ජාතික තත්ත්ව සභාව (NQC) යටතේ SLAB සහ අනෙකුත් NQI ආයතන ස්ථානගත කිරීම සඳහා බලපෑම් ඇති කිරීම | |
| | | 3. SLAB සන්නාමය ප්‍රවර්ධනය කිරීම | 1.SLAB සන්නාමය රට තුළ සහ ඉන් පිටත ප්‍රවර්ධනය කිරීම | 1. සන්නාම ක්‍රියාකාරකම් ගණන |
| 2. | අපක්ෂපාතීත්වය සහතික කරමින් ප්‍රතිනතනය පුළුල් කිරීම | 1. පවතින ප්‍රතිනතන යෝජනා ක්‍රමවල සේවාදායකයින් සංඛ්‍යාව වැඩි කිරීම | 1. වෙළඳපල බුද්ධිමය ජාලය ශක්තිමත් කිරීම.<br>2. වෙළෙඳපොළ ප්‍රවර්ධනය<br>3. ජාතික/ ජාත්‍යන්තර යෝජනා ක්‍රම හිමිකරුවන් සමඟ අවබෝධතා ගිවිසුම් ඇති කර ගැනීම. | 1. සේවාලාභීන් සංඛ්‍යාවේ ප්‍රතිශතය වැඩිවීම<br>2. විෂය පථය දිගු කිරීම් ගණන<br>3. හඳුන්වා දුන් නව ප්‍රතිනතන යෝජනා ක්‍රම ගණන |
| | | 2. පවතින සේවාදායකයින්ගේ විෂය පථ ගණන වැඩි කිරීම | | |
| | | 3. නව ප්‍රතිනතන යෝජනා ක්‍රම හඳුන්වා දීම | | |
| 3. | ප්‍රතිනතනය කිරීමේදී නියාමකයින්ගේ ක්‍රියාකාරී මැදිහත්වීම | 1. නියාමකයින් විසින් පිළිගත් අනුකූලතා තක්සේරු සේවා භාවිතය ප්‍රවර්ධනය කිරීම<br><br>2. SLAB ජාත්‍යන්තරව පිළිගත් ප්‍රතිනතන සේවා සඳහා ඔවුන්ගේ රෙගුලාසිවල SLAB ප්‍රතිනතනය ලත් සේවාවන් සඳහන් කිරීමට නියාමකයින් දිරිමත් කිරීම | 1. නියාමකයින් ඉළක්ක කර ගනිමින් සාදන ලද වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.<br>2. SLAB හි තීරණ ගැනීමේ කමිටුවල නියාමකයින් නියෝජනය ලබා ගැනීම.<br>3. නියාමකයින් ඔවුන්ගේ රෙගුලාසිවලට අදාළ විභව ප්‍රතිනතන යෝජනා ක්‍රම සමඟ සිතියම්ගත කිරීම සහ පෙළගැස්වීම<br>4.නියාමක සම්බන්ධීකරණ වැඩසටහන් ක්‍රියාත්සක කිරීම. | 1.SLAB සමග කටයුතු කරන නියාමකයින් සංඛ්‍යාව<br>2. පිළිගත් අනුකූලතා තක්සේරු සේවා භාවිතා කිරීමට ඒත්තු ගැන්වූ නියාමකයින් සංඛ්‍යාව<br>3. ප්‍රතිනතනය ලත් අනුකූලතා තක්සේරු සේවා සඳහන් කරමින් නිකුත් කරන ලද රෙගුලාසි ගණන |
| 4. | පුද්ගල නිපුණතා සංවර්ධනය සහ හිතකර සේවා පරිසරයක් ඇති කර ගැනීම කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් ආයතනික ධාරිතාව ශක්තිමත් කිරීම | 1. ප්‍රතිනතනයේ පුළුල් වන අවශ්‍යතා සපුරාලීම සඳහා ආයතනයේ තාක්ෂණික ධාරිතාව පුළුල් කිරීම | 1. පවතින මානව සම්පත් සංවර්ධනය සහ නව කාර්ය මණ්ඩල බඳවාගැනීමට ක්‍රියා කිරීම.<br><br>2. සුදුසු තාක්ෂණය, නෛතික, පාරිසරික සහ සමාජීය තත්ත්ව වැඩිදියුණු කිරීම් සමඟින් සුහුරු ආයතනයක් බවට පත් කිරීම. | 1. ලබා දුන් නව නිපුණතා ප්‍රමාණය<br>2. නව තාක්ෂණික, නීතිමය සහ සමාජීය වැඩිදියුණු කිරීම් ගණන |
| | | 2. හිතකර සේවා පරිසරයක් සහ කාර්ය මණ්ඩල සුබසාධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | | |
| 5. | මූල්‍ය හා පාරිසරික තිරසාරභාවය සහතික කිරීම | **1. SLAB** මූල්‍යමය වශයෙන් ස්ථාවර සහ තිරසාර කිරීමට කටයුතු කිරීම. | 1. වත්මන් ප්‍රතිනතන යෝජනා ක්‍රමවල සේවාදායක පදනම වැඩි කිරීම<br>2. වෙළෙඳපොළ ඉල්ලුම මත නව ප්‍රතිනතන යෝජනා ක්‍රම හඳුන්වා දීම<br>3. පුහුණු වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම | 1. වත්මන් ප්‍රතිනතන යෝජනා ක්‍රම හරහා ආදායමේ ප්‍රතිශතය වැඩි වීම<br>2. පුහුණු වැඩසටහන් හරහා ආදායමේ ප්‍රතිශතය වැඩි වීම |

| | | | | |
|---|---|---|---|---|
| | | | 4. SLAB හි විෂය පථය තුළ නව ආදායම් උපයන ව්‍යාපාර හඳුනා ගැනීම | |
| | | 2. **වඩාත් යහපත් පාරිසරික භාවිතයන් හඳුන්වා දීම.** | 1.බලශක්ති කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම<br>2.දේශගුණික හිතකාමී වැඩසටහන්<br>3. ද්‍රව්‍ය භාවිතය කාර්යක්ෂමතාව<br>4. හරිත වාර්තාකරණය ප්‍රවර්ධනය කිරීම. | 1. බලශක්ති භාවිතයේ ප්‍රතිශතය අඩු වීම<br>2. ද්‍රව්‍ය භාවිතයේ ප්‍රතිශතය අඩු වීම<br>3 GHG විමෝචනයේ ප්‍රතිශතය අඩු වීම |
| 6. | ප්‍රතීතන ඇගයීම්වල අපක්ෂපාතීත්වය රැකගනිමින් ප්‍රතීතනය සඳහා ජාත්‍යන්තර පිළිගැනීම පවත්වා ගැනීම සහ වැඩිදියුණු කිරීම. | 1.SLAB **ප්‍රතීතනය ලබා ගත් අනුකූලතා තක්සේරු ආයතන විසින් නිකුත් කරන ලද අනුකූලතා තක්සේරු වාර්තා සඳහා ජාත්‍යන්තර පිළිගැනීම සහතික කිරීමට කටයුතු කිරීම.** | 1. SLAB ප්‍රතීතනය ප්‍රවර්ධනය කිරීමේදී වත්මන් ගැටළු, නව අවශ්‍යතා සහ ශක්‍යතා විසඳුම් හඳුනා ගැනීම සඳහා අදාළ සංවිධාන (EDB, වාණිජ දෙපාර්තමේන්තුව, අපනයනකරුවන්ගේ සංගම්, ප්‍රතීතනය ලත් CABs, සාමාජික ABs) සමඟ ජාලගත කිරීම.<br><br>2. ජාත්‍යන්තර ප්‍රතීතන සංවිධානවල අදාළ සංසදවල නියෝජනය, සම ඇගයීම්, පුහුණු කිරීම් සහ SLAB ප්‍රතීතනය ප්‍රවර්ධනය කිරීම.<br><br>3. SLAB හි වත්මන් ජාත්‍යන්තර පිළිගැනීමේ තත්ත්වය වැඩිදියුණු කිරීම. | 1. ප්‍රතීතනය ලත් සහතික/වාර්තා පිළිබඳ ගැටළු සංඛ්‍යාව SLAB මැදිහත්වීමෙන් විසඳා ඇත<br>2. නව MLA/MRA සඳහා අයදුම්පත්<br>3. නව MRA/MLA පිළිගැනීම්.<br><br>4. සහභාගී වූ රැස්වීම්/සංසද ගණන |
| | | 2. කලාපීය සහ ගෝලීය මට්ටමේ ප්‍රතීතන වර්ධනයන් සඳහා දායක වීම | 1 APAC සම ඇගයීම්වලට සහභාගී වීම.<br>2. රැස්වීම්/කමිටුවලට සහභාගී වීම<br>3. පුහුණු වැඩසටහන් වල සම්පත් දායකයකන් ලෙස සහභාගී වීම. | 1. සහභාගී වූ සම ඇගයීම්, රැස්වීම්, කමිටු සංඛ්‍යාව |

## 1.3. ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ කාර්යයන්

- ජාත්‍යන්තර සහ ජාතික ප්‍රමිතීන්ට අනුකූලව, අනුකූලතා තක්සේරු ආයතන සඳහා ප්‍රතීතනය ලබා දීම.
    - පරීක්ෂණාගාර (ISO/IEC 17025)
    - ක්‍රමාංකන රසායනාගාර (ISO/IEC 17025)
    - වෛද්‍ය රසායනාගාර (ISO 15189)
    - පද්ධති සඳහා සහතික කිරීමේ ආයතන (ISO/IEC 17021)
    - නිෂ්පාදන සඳහා සහතික කිරීමේ ආයතන (ISO/IEC 17065)
    - පුද්ගලයන් සඳහා සහතික කිරීමේ ආයතන (ISO/IEC 17024)
    - වලංගු කිරීමේ හා සත්‍යාපන ආයතන (ISO/IEC 17029)
    - හරිතාගාර වායු (GHG) වලංගු කිරීමේ/සත්‍යාපන ආයතන (ISO 14065)
    - පරීක්ෂණ ආයතන (ISO/IEC 17020)
    - ප්‍රවීණතා පරීක්ෂණ වැඩසටහන් (ISO/IEC 17043); හා
    - හොඳ රසායනාගාර පරිචයන් සඳහා පුහුණුව (GLP)

- ජාතික තත්ත්ව ප්‍රතිපත්තියේ දක්වා ඇති මාර්ගෝපදේශයන්ට අනුකූලව ප්‍රතීතන ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම.

- අදාළ පාර්ශවකරුවන් සඳහා තක්සේරු පුහුණු වැඩසටහන්, දැනුවත් කිරීමේ වැඩසටහන් සහ සම්මන්ත්‍රණ පැවැත්වීම

- අනුකූලතා තක්සේරුව සම්බන්ධයෙන් සහයෝගිතාවය සහ සම්බන්ධතා සඳහා ජාතික සංසදය ලෙස කටයුතු කිරීම.

- තාක්ෂණික දැනුම ප්‍රවර්ධනය කිරීම සහ බෙදා හැරීම තුළින් ප්‍රතීතන පරිචයන් සහ තක්සේරු ක්‍රියා පටිපාටිවල නිපුණතාවය ඇති කිරීම.

- ප්‍රතීතනය සඳහා ජාතික පද්ධති සඳහා සහාය වීම සහ සංවර්ධනය කිරීම.

- සමාන විදේශීය හා ජාත්‍යන්තර ආයතන සමඟ අන්‍යෝන්‍ය පිළිගැනීම පිළිබඳ ගිවිසුම් අත්සන් කිරීම.

- ප්‍රතීතනය ලබා දීම, විෂය පථය දිගු කිරීම, විෂය පථය අඩු කිරීම, ප්‍රතීතනය අත්හිටුවීම හෝ ඉවත් කර ගැනීම සඳහා අනුකූලතා සහ සාක්ෂි තක්සේරු කිරීම් සංවිධානය කිරීම, කළමනාකරණය කිරීම සහ පැවැත්වීම.

# 2. පාලක සභාව

2005 අංක 32 දරන අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩල පනතේ විධිවිධාන යටතේ අමාත්‍යවරයා විසින් පත් කරන ලද සාමාජිකයින් දහතුන් දෙනෙකුගෙන් (13) සමන්විත පාලක සභාව වෙත මණ්ඩලයේ බලතල සහ කාර්යයන් පැවරී ඇත. අවශ්‍ය ප්‍රතිපත්තිමය තීරණ ගැනීම සඳහා සෑම මසකම පාලක සභාව රැස්වේ.

2020 දෙසැම්බර් 31 වන දිනට පාලක මණ්ඩලයේ සංයුතිය පහත පරිදි විය.

ආචාර්ය සම්පත් වාහල – සභාපති

ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ කළමනාකරණ අධ්‍යයන පීඨයේ
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය.

ආර් එම් එස් පී එස් බණ්ඩාර මහතා- සාමාජික

අධ්‍යක්ෂ භාණ්ඩාගාර මෙහෙයුම්,
මහා භාණ්ඩාගාරය නියෝජනය කරමින්

ආචාර්ය සිද්ධිකා සේනාරත්න මිය - සාමාජික

අධ්‍යක්ෂ ජනරාල්,
ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය

එස් එන් අකුරන්තිලක මහතා- සාමාජික

වැඩ බලන අධ්‍යන්ෂ ජනරාල්, සහකාර අධ්‍යක්ෂ
මිනුම් ඒකක, ප්‍රමිති සහ සේවා දෙපාර්තමේන්තුව,

එම් එම් ජී කේ මීගහකොටුව මිය - සාමාජික

අධ්‍යක්ෂ (තාක්ෂණ හා පර්යේෂණ)
විද්‍යා තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය

නිරංජන් දිසානායක මහතා- සාමාජික

ලංකා වාණිජ මණ්ඩලයේ ආනයන අංශයේ ශ්‍රී ලංකා කළමණාකරු/උප සභාපති

වී. සිවඥානසෝති මහතා- සාමාජික

ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් සහ පුනරුත්ථාපන,
උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යාංශයේ හිටපු ලේකම්.

ජේ එම් සමන් එන් ජයසිංහ මහතා - සාමාජික

අතිරේක ලේකම්, අභයන්තර වෙළෙඳ, ආහාර සුරක්ෂිතතා සහ පාරිභෝගික සුභසාධන අමාත්යාංශය

පී පී එස් ආර් ද සිල්වා මහතා - සාමාජික

ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්, දේශීය වෛද්‍ය සේවා, සෞඛ්‍ය අමාත්‍යාංශය

රුවන් ද සිල්වා මහතා - සාමාජික

වාණිජ හා කර්මාන්ත මණ්ඩලය (FCCI).

# 3. ව්‍යවස්ථාපිත කමිටු

## 3.1. විගණන කමිටුව

විගණන කමිටුව විධායක නොවන පාලක මණ්ඩල සභිකයින් තුන් දෙනෙකුගෙන් හා විගණකාධිපති නියෝජනය කරමින් නියෝජිතයෙකුද මණ්ඩලයේ අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරී (කමිටු ලේකම්) සහකාර අධ්‍යක්ෂ මුදල් හා පාලන, අභ්‍යන්තර විගණක යන අයගෙන් සමන්විත වේ. පාලක සභාවේ මහා භාණ්ඩාගාරය නියෝජනය කරන නියෝජිතයා කමිටුවේ සභාපතිත්වය හොබවයි.

කමිටුවේ ප්‍රධාන කාර්ය භාරය වනුයේ ඵලදායි අභ්‍යන්තර පාලන ක්‍රමයක් පවත්වාගෙන යාම සඳහා සහ එහි බාහිර මූල්‍ය වාර්තාකරණ වගකීම් ඉටු කිරීම හා එහි වගකීම් ඉටුකිරීමේදී පාලක සභාවට සහාය වීමයි. **ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය** සතුව ස්වාධීන අභ්‍යන්තර විගණන ක්‍රියාවලික් ඇති අතර එය විගණන කමිටුවට වාර්තා කරයි. බාහිර විගණන කටයුතුවල සඵලතාවය අධීක්ෂණය කිරීම සහ කවුන්සිලයට නිර්දේශ ඉදිරිපත් කිරීම ද කමිටුවේ වගකීම වේ.

මෙම කමිටුව වසර තුළදී රැස්වීම් 01ක් පවත්වා ඇති අතර **ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය** ආයතනයේ අභ්‍යන්තර විගණක සහ විගණකාධිපති විසින් ඉදිරිපත් කරන ලද සියලුම වාර්තා සමාලෝචනය කරන අතර සියලුම විගණන කමිටු රැස්වීම්වල වාර්තා පාලක සභාවේ රැස්වීම්වලදී සභාගත කරනු ලැබේ.

| | | |
|---|---|---|
| ආර්.එම්.එස්.පී.එස්. බණ්ඩාර මහතා | සභාපති/ මහා භාණ්ඩාගාරය | මහා භාණ්ඩාගාරය නියෝජනය කරමින්, |
| එම්.එම්.ජී.කේ.මීගහකොටුව මිය | සාමාජික/ පාලක සභික | විද්‍යා තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය නියෝජනය කරමින්, |
| වී.සිවඥානසෝති මහතා | සාමාජික/ පාලක සභික | ජාතික ප්‍රතිපත්ති, ආර්ථික අමාත්‍යාංශය කටයුතු, නැවත පදිංචි කිරීම් සහ පුනරුත්ථාපන |
| ඩබ්ලිව් ආනන්ද මහතා | නිරීක්ෂක | විගණකාධිපති දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් |
| පත් කර නැත | නිරීක්ෂක | රේඛීය අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක |
| චන්ද්‍රිකා තිලකරත්න මහත්මිය | ලේකම් | අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරී, **ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය** |
| හර්ෂා චන්ද්‍රසිරි මහත්මිය | ආරාධිත | සහකාර අධ්‍යක්ෂ (මුදල් සහ පරිපාලක) වැඩ බලන. **ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය** |
| ටී. වනිගසුන්දර මහත්මිය | කැඳවුම්කරු | අභ්‍යන්තර විගණක, **ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය** |

# 4. මෙහෙයුම් කළමනාකරණය

ශ්‍රී ලංකා ප්‍රතිතන මණ්ඩලයේ කළමනාකරණ කාර්යයන් අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී තනතුරට පැවරී ඇති අතර ඇමුණුම 01 හි දක්වා ඇති ආයතනික ව්‍යුහයේ දැක්වෙන පරිදි තාක්ෂණික, මූල්‍ය සහ පරිපාලන කාර්ය මණ්ඩලයේ සහාය ඇතිව මණ්ඩලයේ සියලුම විධායක කාර්යයන් සිදු කිරීම සඳහා අධ්‍යක්ෂවරයා කටයුතු කරයි.

## 4.1. මානව සම්පත්

ශ්‍රී ලංකා ප්‍රතිතන මණ්ඩලයේ මානව සම්පත සමන්විත වන්නේ සීමිත අභ්‍යන්තර කාර්ය මණ්ඩලයකින් සහ ශාස්ත්‍රීය හා විවිධ වෘත්තීය ආයතන වලින් ලබාගත් තක්සේරු කරුවන්ගේ සංචිතයකිනි. ශ්‍රී ලංකා ප්‍රතිතන මණ්ඩලය අනුකූලතා තක්සේරු ආයතනවල නිපුණතාවය සහතික කිරීම සම්බන්ධයෙන් කටයුතු කරයි. වසර ආරම්භයේ සිටම කාර්ය මණ්ඩල පිරිවැටුම, ශ්‍රී ලංකා ප්‍රතිතන මණ්ඩලයේ ක්‍රියාකාරිත්වයට දැඩි ලෙස බලපෑ නමුත් කාර්ය මණ්ඩලයේ දැඩි කැපවීම මත, අනෙකුත් විදේශීය ප්‍රතිතන ආයතන හා සමානව එහි ප්‍රතිතන පද්ධති පවත්වාගෙන යාමට සමත් විය. සාමාන්‍යයෙන්, නව නිලධාරියෙකුට ස්වාධීනව වැඩ කිරීම සඳහා පත් කිරීමට පෙර අදාළ ක්ෂේත්‍රයක නිපුණතාවයක් දැක්වීමට අවම වශයෙන් වසර තුනක් අවශ්‍ය වේ. ශ්‍රී ලංකා ප්‍රතිතන මණ්ඩල කාර්ය මණ්ඩලය සඳහා 2020 වසරේදී ලබා දී ඇති පුහුණු වැඩසටහන් පිළිබඳ විස්තර ඇමුණුම 04 හි දක්වා ඇත.

## 4.2. කාර්ය මණ්ඩලය



# 5. කාර්ය සාධන විශේෂතා 2020

2020 වර්ෂයේදී ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය වසර 15ක මෙහෙයුම් සම්පූර්ණ කර ඇත. අදාළ ජාත්‍යන්තර ප්‍රමිතීන් මත පදනම්ව පරීක්ෂණ සහ ක්‍රමාංකන රසායනාගාර, වෛද්‍ය රසායනාගාර, සහතික කිරීමේ ආයතන සහ පරීක්ෂණ ආයතන වෙත ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය සිය සේවාවන් අඛණ්ඩව සිදු කරයි. මෙම ප්‍රතීතන යෝජනා ක්‍රම ජාත්‍යන්තර මාර්ගෝපදේශවලට අනුකූලව කළමනාකරණය කරන අතර ISO/IEC 17011 අවශ්‍යතාවයන්ද සපුරමින් ක්‍රියාත්මක කරනු ලැබේ.

## 5.1. ප්‍රතීතන සේවා

**2020** වර්ෂයේදී ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය විසින් පහත දක්වා ඇති පරිදි අනුකූලතා තක්සේරු කිරීමේ ආයතන සඳහා ප්‍රතීතනය ලබා දෙන ලදී.

| ප්‍රතීතන යෝජනා ක්‍රමය | ප්‍රගතිය |
|---|---|
| පරීක්ෂණ රසායනාගාර | නව-05 |
| ක්‍රමාංකන රසායනාගාර | නව-01 |
| සහතික කිරීමේ ආයතන - පද්ධති | විෂය පථය දිගු කිරීම් -01 |
| සහතික කිරීමේ ආයතනය - පද්ධතිය | නව-02, විෂය පථය දිගු කිරීම් -01 |
| වෛද්‍ය රසායනාගාර | නව-03, විෂය පථය දිගු කිරීම් -01 |

## 5.2. පුහුණු වැඩසටහන්

2020 වසර තුළ, ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය විසින් බොහෝ ප්‍රතීතන යෝජනා ක්‍රම ආවරණය වන පරිදි පුහුණු වැඩසටහන් 19ක් පවත්වා ඇති අතර විවිධ අනුකූලතා තක්සේරු කිරීමේ ආයතන සහ කර්මාන්තවලින් 354 දෙනෙකු පුහුණු කර ඇත. 2020 වර්ෂය තුළ මණ්ඩලය විසින් පවත්වනු ලබන වැඩසටහන් පිළිබඳ විස්තර ඇමුණුම 05 හි දක්වා ඇත.

## 5.3. අන්තර්ජාතික කටයුතුවලට සහභාගීවීම

ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය ප්‍රතීතන යෝජනා ක්‍රම සඳහා ජාත්‍යන්තර පිළිගැනීම පවත්වා ගැනීම සඳහා, සාමාජික සංවිධානයක් ලෙස ජාත්‍යන්තර ප්‍රතීතන සංවිධානවල වසර මැද සහ වාර්ෂික රැස්වීම්වලට සහභාගී වේ. මෙම රැස්වීම්වලදී ගනු ලබන තීරණ සඳහා සහභාගී වීමට සහ දායක වීමට ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය සඳහා අනිවාර්ය අවශ්‍යතාවයකි. ඒ අනුව, වසර පුරා පවතින **Covid 19** වසංගතය හේතුවෙන් **2020** වසර තුළ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය පහත සඳහන් ජාත්‍යන්තර සිදුවීම් සඳහා මාර්ගගත රැස්වීම්/දුරස්ථ ඇගයීම් ලෙස සහභාගී වී ඇත.

**APAC 2020** හි වාර්ෂික රැස්වීමට අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී චන්ද්‍රිකා තිලකරත්න මහත්මිය, ප්‍රතීතන නියෝජ්‍ය අධ්‍යක්ෂ එල්. එච්.ඩී. බන්දුසෝම මහතා සහ ප්‍රතීතන නියෝජ්‍ය අධ්‍යක්ෂ චන්දිකා එදිරිවීර මහත්මිය සහභාගී විය.

**Covid 19** වසංගතය හේතුවෙන් **ILAC** සහ **IAF** ඒකාබද්ධ මධ්‍ය වාර රැස්වීම සහ **2020** ඒකාබද්ධ වාර්ෂික රැස්වීම අවලංගු කිරීමට තීරණය කරන ලදී. සියලුම කමිටු රැස්වීම් මාර්ගගතව පවත්වන ලද අතර, අදාළ මාර්ගගත රැස්වීම් සඳහා අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී චන්ද්‍රිකා තිලකරත්න මහත්මිය, ප්‍රතීතන නියෝජ්‍ය අධ්‍යක්ෂ එල්.එච්.ඩී.බී.බන්දුසෝම මහතා සහ නියෝජ්‍ය අධ්‍යක්ෂ ප්‍රතීතනය චන්දිකා එදිරිවීර මහත්මිය සහභාගී විය.

ගෝලීය ප්‍රතීතන සංවිධානවල නිල නියෝජිතවරිය ලෙස අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී චන්ද්‍රිකා තිලකරත්න මහත්මිය අන්තර්ජාලය ඔස්සේ ඡන්දය ප්‍රකාශ කිරීමට සහභාගී වූවාය.

# 6. මූල්‍ය තොරතුරු **2020**

## 6.1. මූල්‍ය විශේෂ අවස්ථා

පුනරාවර්තන වියදම් සඳහා වාර්ෂිකව වෙන් කර ඇති මුදල රුපියල් මිලියන 72.03 කි. පුනරාවර්තන වියදම් සඳහා භාණ්ඩාගාර දායකත්වය රුපියල් මිලියන 19.63 කි. සත්‍ය පුනරාවර්තන වියදම රුපියල් මිලියන 51.50 කි. පුනරාවර්තන වියදම්වල හිඟය උපයාගත් ආදායමෙන් පියවීමට කටයුතු කරන ලදී.

සමාලෝචිත වර්ෂය තුළ, ශ්‍රී ලංකා ප්‍රතිතන මණ්ඩලය විසින් එහි ක්‍රියාකාරකම් වලින් ප්‍රධාන වශයෙන් ප්‍රතිතන සේවා සහ පුහුණු වැඩසටහන් වලින් රුපියල් මිලියන 37.08ක් උපයා ඇත. ආදායම් හා පුනරාවර්තන වියදම් අනුපාතය 72% කි.

2020 වර්ෂය සඳහා භාණ්ඩාගාරයෙන් ප්‍රාග්ධන වියදම් සඳහා ලැබුණු ප්‍රතිපාදන රුපියල් මිලියන 0.5 කි. මුළු ප්‍රාග්ධන වියදම රුපියල් මිලියන 1.97 කි.

සමාලෝචිත වර්ෂය තුළ මණ්ඩලය එහි ක්‍රියාකාරකම් තුළින් වියදම ඉක්මවා ලද ආදායම රුපියල් මිලියන 10.28 ක් විය.

| වසර | පුනරාවර්තන වියදම් (රු. මිලියන) | | | | ප්‍රාග්ධන වියදම් (රු. මිලියන) | | |
|---|---|---|---|---|---|---|---|
| | අයවැය වියදම් | සත්‍ය වියදම් | භාණ්ඩාගාර දීමනා | ඉපැයීම් | සත්‍ය වියදම් | භාණ්ඩාගාර දීමනා | ඉපැයීම් |
| 2007 | 14.70 | 11.50 | 8.23 | 2.83 | 1.50 | 1.40 | 1.50 |
| 2008 | 17.29 | 13.98 | 10.56 | 3.27 | 2.74 | 0.41 | 0.50 |
| 2009 | 19.60 | 15.01 | 11.47 | 3.32 | 2.33 | 0.44 | 0.66 |
| 2010 | 21.81 | 15.51 | 8.91 | 5.30 | 3.57 | 0.63 | 0.50 |
| 2011 | 23.30 | 21.33 | 13.28 | 8.12 | 3.08 | 0.63 | 0.80 |
| 2012 | 28.18 | 29.29 | 15.50 | 12.9 | 1.82 | 1.75 | 1.37 |
| 2013 | 33.00 | 36.61 | 14.80 | 18.08 | 2.00 | 1.51 | 1.50 |
| 2014 | 38.00 | 42.85 | 16.09 | 27.58 | 2.00 | 1.71 | 1.73 |
| 2015 | 64.50 | 63.14 | 12.20 | 55.24 | 3.00 | 1.64 | 1.25 |
| 2016 | 56.00 | 49.43 | 15.70 | 31.74 | 5.20 | 4.67 | 2.00 |
| 2017 | 60.5 | 57.91 | 16.16 | 36.03 | 2.00 | 2.05 | 0.91 |
| 2018 | 66.0 | 59.79 | 17.06 | 45.23 | 4.25 | 3.64 | - |
| 2019 | 71.8 | 66.67 | 19.49 | 47.43 | 6.92 | 2.43 | 1.4 |
| 2020 | 72.70 | 51.50 | 19.64 | 37.08 | 3.69 | 1.97 | 0.5 |

## 6.2. 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය

# අනුකූලතා තක්සේරුව පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය

# 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය

| | සටහන් | සත්‍ය 2020 | සත්‍ය 2019 |
|---|---|---|---|
| වත්කම් | | රු. | රු. |
| **ජංගම වත්කම්** | | | |
| මුදල් සහ මුදල් සමාන | 19 | 30,459,855.03 | 18,913,916.92 |
| දේශීය මිලදී ගැනීම් අත්තිකාරම් | | - | - |
| ලැබිය යුතු දේ | 11 | 4,752,305.03 | 9,782,014.21 |
| මුද්දර | | 15,000.00 | 15,000.00 |
| ලිපි ද්‍රව්‍ය තොගය | | 255,680.69 | 230,264.69 |
| පෙර ගෙවීම් | 17 | 129,040.80 | 149,137.62 |
| ගෙවිය යුතු NBT | | 32,557.83 | 32,557.83 |
| වැටුප් පාලනය | | 7,622.00 | - |
| ඉවත දැමිය හැකි ස්ථාවර වත්කම් | | - | - |
| වැට් බදු පාලනය | | 175,959.01 | 175,959.01 |
| ආපදා ණය | 16 | 1,224,400.00 | 1,114,700.00 |
| ආපසු ගෙවිය හැකි තැන්පතු සහ අත්තිකාරම් | 10 | 3,520,500.00 | 2,195,700.00 |
| | | 40,572,920.39 | 32,609,250.28 |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපල කම්හල සහ උපකරණ | 31 | 9,925,358.63 | 18,409,906.15 |
| ආපදා ණය | 16 | 1,478,346.12 | 1,076,826.52 |
| **අස්පෘශ්‍ය වත්කම්** | | | |
| බුද්ධිමය දේපල සහ සංවර්ධන ක්‍රියාකාරකම් | 18 | 364,895.01 | 313,693.02 |
| පාරිතෝෂික සඳහා ආයෝජනය | | 3,376,551.64 | 3,073,218.19 |
| | | 15,145,151.40 | 22,873,643.88 |

| | | | |
|---|---|---|---|
| **මුළු වත්කම්** | | **55,718,071.79** | **55,482,894.16** |
| **වගකීම්** | | | |
| ජංගම වගකීම් | | | |
| වෛද්‍ය රක්ෂණය | | 750.00 | 2,400.00 |
| ණය හිමියන් | **23** | 683,863.42 | 530,246.53 |
| උපචිත සහ අනෙකුත් ගෙවිය යුතු දේ | **14** | 3,570,621.28 | 5,462,668.29 |
| වාර්ෂික නිවාඩු සඳහා ප්‍රතිපාදන | | 603,841.67 | 361,998.07 |
| අත්තිකාරම් ලැබිණි | **27** | 339,304.35 | 339,304.35 |
| පාරිතෝෂික ප්‍රතිපාදන | | - | - |
| උපචිත සහ අනෙකුත් ගෙවිය යුතු දේ | | **5,198,380.72** | **6,696,617.24** |
| **ජංගම නොවන වගකීම්** | | | |
| පාරිතෝෂිකය සඳහා ප්‍රතිපාදන | **24** | 5,311,154.50 | 3,692,078.00 |
| **සුළු වගකීම්** | | **10,509,535.22** | **10,388,695.24** |
| **ශුද්ධ වත්කම්** | | **45,208,536.57** | **45,094,198.92** |
| | **12** | 55,628,074.35 | 51,897,167.02 |
| ශුද්ධ වත්කම් / කොටස් | **13** | (12,234,137.78) | (8,617,568.10) |
| සමුච්චිත අරමුදල | **20** | 1,814,600.00 | 1,814,600.00 |
| **ශුද්ධ වත්කම් / කොටස්** | | **45,208,536.57** | **45,094,198.92** |

පිටු 5 සිට 8 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු 9 සිට 14 දක්වා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයක් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා සභා සාමාජිකයන් වගකිව යුතුය. මෙම මූල්‍ය වාර්තාවට මණ්ඩලයේ පාලක සභාව වෙනුවෙන් අත්සන් කර ඇත.



.....

ආර්.එම්.එස්.පී.එස් බණ්ඩාර ය

සභා සාමාජික

මහා භාණ්ඩාගාරය නියෝජනය කරමින්



.....

ආචාර්ය සිද්ධික සේනාරත්න

සභා සාමාජික



.....

චන්ද්‍රිකා තිලකරත්න

අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරී

ශ්‍රී ලංකා ප්‍රතිතන මණ්ඩලය



.....

කේ.එච්.එන් චන්ද්‍රසිරි

වැඩ බලන-සහකාර අධ්‍යක්ෂ (මුදල්/පරිපාලක)-

ශ්‍රී ලංකා ප්‍රතිතන මණ්ඩලය

## 6.3. 2020 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය

**අනුකූලතා තක්සේරුව පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය**

**2020 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා**

**මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශය**

| | සටහන් | සත්‍ය 2020 රු. | සත්‍ය 2019 රු. | අයවැය |
|---|---|---|---|---|
| ආදායම | **1** | **61,760,518.61** | **73,108,659.80** | **72,703,700.00** |
| **මුළු ආදායම** | | **61,760,518.61** | **73,108,659.80** | **72,703,700.00** |
| **පරිපාලන සහ ආයතන වියදම්** | | | | |
| පුද්ගල පඩි නඩි | **2** | 22,991,533.86 | 23,196,340.54 | 30,753,400.00 |
| ගිවිසුම්ගත සේවා | **6** | 17,489,168.26 | 24,908,967.43 | 28,431,400.00 |
| සැපයුම් | **4** | 1,711,047.38 | 1,644,877.60 | 1,850,000.00 |
| දායකත්ව සහ සාමාජික ගාස්තු | **7** | 1,772,429.82 | 1,716,318.18 | 2,059,500.00 |
| ගමන් වියදම් | **3** | 324,110.94 | 2,402,511.50 | 2,728,450.00 |
| නඩත්තු වියදම් | **5** | 2,047,728.91 | 2,651,430.67 | 3,979,600.00 |
| වෙනත් | **8** | 5,136,494.76 | 10,132,611.24 | 1,871,350.00 |
| මූල්‍ය පිරිවැය සහ වෙනත් | **9** | 5,000.00 | 21,950.00 | 30,000.00 |

| | | | |
|---|---|---|---|
| අසම්භාව්‍ය බැරකම් සඳහා වෙන්කිරීම් | - | - | 1,000,000.00 |
| **මුළු වියදම** | **51,477,513.93** | **66,675,007.16** | **72,703,700.00** |
| **වියදමට වැඩි වූ අතිරික්තය** | **10,283,004.68** | **6,433,652.64** | - |

## 6.4. 2020 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය

**අනුකූලතා තක්සේරුව පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය**

**2020 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා**

**ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය**

| | කල් දැමූ ආදායම | වෙනත් දීමනා | සමුච්චිත අරමුදල | සමස්ත |
|---|---|---|---|---|
| **2019 ජනවාරි 1 වන දිනට ශේෂය** | 9,940,521.20 | 1,814,600.00 | 30,862,107.48 | 42,617,228.68 |
| පෙර වසර ගැලපීම | - | - | - | - |
| 2019 ජනවාරි 1 වන දිනට ශේෂය | 9,940,521.20 | 1,814,600.00 | 30,862,107.48 | 42,617,228.68 |
| ප්‍රාග්ධන වත්කම් සඳහා ලැබුණු සහ භාවිතා කරන ලද ප්‍රදානය | 1,400,000.00 | | - | 1,400,000.00 |
| වර්ෂය සඳහා ක්ෂයවීම් වියදම් | (5,185,517.88) | | - | (5,185,517.88) |
| ක්ෂයවීම් ගැලපීම අවසන් | 5,431.51 | | | 5,431.51 |
| SLAB තොරතුරු තාක්ෂණ වැඩසටහන ක්‍රමක්ෂ කිරීම | - | | - | - |
| ප්‍රවීණතා පරීක්ෂණ වැඩසටහන ක්‍රමක්ෂ කිරීම | (176,596.03) | | | (176,596.03) |
| SLAB හි ගිණුම්කරණ පැකේජය ක්‍රමක්ෂ කිරීම | - | | 6,433,652.64 | 6,433,652.64 |
| වර්ෂය සඳහා අතිරික්තය / (හිඟය). | | | | |
| **ශේෂය 2019 දෙසැම්බර් 31 දිනට** | **5,983,838.80** | **1,814,600.00** | **37,295,760.12** | **45,094,198.92** |
| **2020 ජනවාරි 1 වන දිනට ශේෂය** | 5,983,838.80 | 1,814,600.00 | 37,295,760.12 | 45,094,198.92 |
| ප්‍රාග්ධන වත්කම් සඳහා ලැබුණු සහ භාවිතා කරන ප්‍රදානය | 500,000.00 | | - | 500,000.00 |
| වර්ෂය සඳහා ක්ෂයවීම් වියදම් | (4,028,271.67) | | - | (4,028,271.67) |

| | | | | |
|---|---|---|---|---|
| ස්ථාවර වත්කම් ලෙස ගෙන ඇති වත්කම් | - | | | (108,832.61) |
| ප්‍රතිනත ලැබිය යුතු ආදායම් ගැලපීම | | | | (259,200.00) |
| ප්‍රවිණතා පරීක්ෂණ වැඩසටහන් ක්‍රමක්ෂ කිරීම | (88,298.01) | | | (88,298.01) |
| පුහුණු ලැබිය යුතු ආදායම් ගැලපීම | | | | (42,244.89) |
| මෝටර් රථ ක්ෂයවීම් ගැලපීම සකසන්න | | | | 8,683,333.34 |
| ක්ෂයවීම් ගැලපීම | - | | | (14,825,153.19) |
| වර්ෂය සඳහා අතිරික්තය / (හිඟය). | | | 10,283,004.68 | 10,283,004.68 |
| **ශේෂය 2020 දෙසැම්බර් 31 දිනට** | **2,367,269.12** | **1,814,600.00** | **47,578,764.80** | **45,208,536.57** |

## 6.5. 2020 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

**අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය**

**2020 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| විස්තර | 2020 | 2019 |
|---|---|---|
| | Rs. | Rs. |
| **වසර සඳහා අතිරික්තය** | 10,283,004.68 | 6,433,652.64 |
| **ගැලපීම්;** | | |
| ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය | (6,642,821.30) | (6,971,582.32) |
| ස්ථාවර වත්කම්වල ක්ෂයවීම් | 4,028,271.67 | 5,185,517.88 |
| පාරිතෝෂික වෙන්කිරීම | 1,619,076.50 | 949,167.00 |
| ස්ථාවර වත්කම් බැහැර කිරීමෙන් පාඩු/ලාභය | - | 30,480.10 |
| SLAB IT වැඩසටහන ක්‍රමක්ෂ කිරීම | - | - |
| ඉවත දැමිය හැකි ස්ථාවර වත්කම් | - | (35,980.10) |
| වාර්ෂික නිවාඩු සඳහා වෙන් කිරීම | 603,841.67 | 361,998.07 |
| පාරිතෝෂිකය සඳහා ගෙවීම | - | 484,390.00 |
| පාරිතෝෂිත ආයෝජනයෙන් පොලී | 303,333.45 | 298,303.34 |
| ප්‍රවීණතා පරීක්ෂණ ක්‍රමක්ෂ කිරීම | 88,298.01 | 176,596.03 |
| ගිණුම්කරණ පැකේජය ක්‍රමක්ෂ කිරීම | - | - |
| **කාරක ප්‍රාග්ධනය වෙනස් වීමට පෙර මෙහෙයුම් අතිරික්තය** | | |
| | **10,283,004.68** | **6,912,542.64** |
| **කාරක ප්‍රාග්ධන වෙනස්කම්** | | |
| කලින් ලැබුණු අඩු කිරීම / (වැඩිවීම). | - | (226,000.00) |
| පෙරගෙවුම් වල අඩු කිරීම /(වැඩිවීම). | 20,096.82 | 86,916.91 |
| LP අත්තිකාරම් වැඩි කිරීම/(අඩු වීම). | - | - |
| වෛද්‍ය රක්ෂණයේ වැඩිවීම/(අඩුවීම). | (1,650.00) | 2,400.00 |
| ලැබිය යුතු මුදල් අඩු කිරීම /(වැඩිවීම). | 4,728,264.28 | (4,196,395.63) |
| පාරිතෝෂිත ප්‍රතිපාදන වැඩි කිරීම/(අඩු වීම). | - | (385,987.50) |
| ආපසු ගෙවිය හැකි තැන්පතු වැඩි කිරීම/(අඩු වීම). | (1,324,800.00) | 929,016.00 |
| ණය හිමියන්ගේ වැඩි වීම/(අඩුවීම). | 153,616.89 | 108,184.76 |
| වාර්ෂික නිවාඩු ප්‍රතිපාදන වැඩි කිරීම/(අඩු වීම). | 241,843.60 | 165,852.34 |
| වැටුප් පාලනය වැඩි කිරීම/(අඩු වීම). | (7,622.00) | - |

| | | |
|---|---|---|
| ඉවත දැමිය හැකි ස්ථාවර වත්කම්වල වැඩි කිරීම/(අඩු වීම). | - | 35,980.10 |
| උපචිත වියදම් වැඩි කිරීම/(අඩු වීම). | (1,199,781.26) | 1,100,491.13 |
| ගෙවිය යුතු NBT හි වැඩි කිරීම/(අඩුවීම). | - | (32,435.38) |
| වැට් බදු පාලනය වැඩි කිරීම/(අඩු වීම). | - | (74,492.72) |
| තොගයේ සහ අනෙකුත් අයිතමවල වැඩි කිරීම/(අඩු වීම). | (25,416.00) | (62,507.18) |
| මුද්දර වල වැඩි කිරීම/(අඩු වීම). | - | - |
| ගෙවිය යුතු අනෙකුත් වැඩිකිරීම්/(අඩුවීම). | (692,265.75) | (568,756.79) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ප්‍රවාහයන්** | **12,175,291.26** | **3,794,808.68** |

**ආයෝජන ක්‍රියාකාරකම් වලින් මුදල් ගලා ඒම**

| | | |
|---|---|---|
| ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම | (1,794,376.60) | (2,432,752.64) |
| SLAB ගිණුම්කරණ පැකේජය | (139,500.00) | - |
| ඉවතලන භාණ්ඩ විකිණීමෙන් ලැබෙන ආදායම | - | 5,500.00 |
| වර්ෂය තුළ ආපදා ණය ප්‍රදානය කරන්න | (1,950,000.00) | (1,400,000.00) |
| වර්ෂය තුළ ආපදා ණය අයකර ගැනීම | 1,438,780.40 | 1,217,550.00 |
| පාරිතෝෂික සඳහා ගෙවීම | - | (484,390.00) |
| පාරිතෝෂිකය සඳහා ප්‍රතිපාදන | 1,619,076.50 | 850,764.50 |
| පාරිතෝෂික ආයෝජනයෙන් පොලී | (303,333.45) | (298,303.34) |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා භාවිතා කරන ශුද්ධ මුදල්** | **(1,129,353.15)** | **(2,541,631.48)** |

**මූල්‍ය ක්‍රියාකාරකම් වලින් මුදල් ගලා එම**

| | | |
|---|---|---|
| රජයේ ආධාර ලැබිණි | 500,000.00 | 1,400,000.00 |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වල භාවිතා කරන ශුද්ධ මුදල්** | **500,000.00** | **1,400,000.00** |
| මුදල් සහ මුදල් සමාන අගයන්හි ශුද්ධ වැඩිවීම/අඩුවීම | 11,545,938.11 | 2,653,177.20 |
| වසර ආරම්භයේදී මුදල් සහ මුදල් සමාන මුදල් | 18,913,916.92 | 16,260,739.72 |
| **වසර අවසානයේ මුදල් සහ මුදල් සමාන මුදල්** | **30,459,855.03** | **18,913,916.92** |

## 6.6. මූල්‍ය ප්‍රකාශනයේ සටහන්

**අනුකූලතා තක්සේරුව සඳහා ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය**

1.1 සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති.

පොදු

අනුකූලතා තක්සේරු සඳහා ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය යනු 2005 අංක 32 දරන අනුකූලතා තක්සේරු කිරීමේ පනත යටතේ පිහිටුවා ඇති ශ්‍රී ලංකාව සඳහා වන ජාතික ප්‍රතීතන අධිකාරියයි.

ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ ලියාපදිංචි කාර්යාලය සහ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය ශ්‍රී ලංකාව, බොරැල්ල, කිතුල්වත්ත පාර, 104/A හි පිහිටා ඇත.

1.2 සකස් කිරීමේ සහ ගිණුම්කරණ ප්‍රතිපත්තිවල පදනම.

රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ අංක 3/2013 අනුව ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත.

1.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති (SLPSAS 1)

2020 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වන වසර සඳහා වන මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන් සමඟ දරයි.

1.2.2 අඛණ්ඩ පැවැත්ම

පාලක සභාව විසින් ශ්‍රී ලංකා අධ්‍යක්ෂ මණ්ඩලයට අඛණ්ඩව පවත්වාගෙන යාමට ඇති හැකියාව පිළිබඳව තක්සේරුවක් කර ඇති අතර ඔවුන් ඇවර කිරීමට හෝ මෙහෙයුම් නතර කිරීමට අදහස් නොකරයි.

1.2.3 දායක සැලසුම් නිර්වචනය

සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාර අරමුදල

නීති රීති සහ රෙගුලාසිවලට අනුකූලව සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල සඳහා සේවකයින් සුදුසුකම් ලබයි. ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය විසින් EPF සහ ETF සඳහා පිළිවෙළින් දළ වැටුපෙන් 15% සහ 3% දායක වේ. EPF සහ ETF වෙත ලැබෙන සියලුම ප්‍රේෂණ කිසිදු හිඟයකින් තොරව නියමිත වේලාවට සිදු කර ඇත.

1.3. වත්කම් සහ ඒවා අගය කිරීමේ පදනම

ශේෂ පත්‍ර දිනයේ ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කර ඇති වත්කම් සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුළ හෝ ශේෂ පත්‍රයේ දින සිට වසරක් ඇතුළත මුදල් වශයෙන් ලබා ගැනීමට බලාපොරොත්තු වන ඒවා වේ. ජංගම වත්කම් හැර අනෙකුත් වත්කම් යනු ශේෂ පත්‍ර දින සිට වසරක කාල සීමාවකට ඔබ්බෙන් තබා ගැනීමට මණ්ඩලය අදහස් කරන ඒවා ජංගම නොවන වත්කම් වේ.

සංවර්ධන ක්‍රියාකාරකම් යටතේ පෙන්වා ඇති ප්‍රවීණතා පරීක්ෂණ වැඩසටහන් වියදම් වසර ආරම්භයේදී එහි ගෙන ගිය ඉදිරි ශේෂයෙන් 50%ක් ක්‍රමක්ෂ කර ඇත.

1.3.1 දේපල යන්ත්‍ර සහ උපකරණ

දේපල යන්ත්‍ර සහ උපකරණ පිරිවැය ක්‍රමයට දක්වා ඇත. එවැනි වත්කම්වල ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ජීවිත කාලය තුළ පිරිවැය කපා හැරීම සඳහා පහත සඳහන් වාර්ෂික ගාස්තු යටතේ සරල මාර්ග ක්‍රමයට ක්ෂයවීම් ලබා දී ඇත.

| වත්කම | වත්කම් කෂය අනුපාතය |
|---|---|
| මෝටර් රථය | 12.5% |
| ගෘහභාණ්ඩ | 20% |
| කාර්යාල උපකරණ, දුරකථන සහ ෆැක්ස් යන්ත්‍රය | 20% |
| වායු සමීකරණ සහ ශීතකරණ ඒකක | 12.5% |
| පරිගණකය, මුද්‍රණ යන්ත්‍රය, බහුමාධ්‍ය ප්‍රොජෙක්ටරය සහ ඡායාරූප පිටපත් යන්ත්‍ර | 25% |
| ගොඩනැගීම සහ ව්‍යුහය | 33.33% |

වත්කම් ක්ෂය වීම ආරම්භ වන්නේ වත්කම භාවිතයට ඇති විට වන අතර බැහැර කිරීම සඳහා හඳුනාගෙන ඇති වසර අවසානයේ නතර වේ. වසර අවසානයේ බැහැර කිරීමට හඳුනාගෙන ඇති ඕනෑම වත්කමක්, එම අයිතමයන් ඒ දක්වා ක්ෂය කරනු ලැබේ. රුපියල් 5,000 කට වැඩි වටිනාකමක් ඇති භාණ්ඩ ස්ථාවර වත්කම් ලෙස සලකනු ලබන අතර අනෙකුත් ඒවා පරිභෝජන භාණ්ඩ ලෙස සැලකේ.

1.3.2 අස්පෘශ්‍ය වත්කම්

ශ්‍රී ලංකාවේ ගුණාත්මක යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ස්වීඩන් රජයෙන් ප්‍රදානයක් ලෙස S ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩල වෙබ් අඩවිය සහ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩල තොරතුරු තාක්ෂණ පද්ධතිය සඳහා මෘදුකාංග සත්කාරකත්වය ලබාගෙන ඇත. මෙම ව්‍යාපෘතිය 2010 වසර අවසානයේ අවසන් කර ඇත. මෙම ප්‍රාග්ධන පිරිවැය ජංගම නොවන වත්කම් ලෙස පිළිගෙන ඇති අතර යම් යම් වෙනස් කිරීම් සිදු කරන ලද බැවින් 2013 සිට ආරම්භ වී වසර 5ක් ඇතුළත ක්‍රමක්ෂ කිරීමට තීරණය කර ඇත.

1. 4 තොග භාණ්ඩ

තොග අයිතමයන් නොමැති අතර ලිපි ද්‍රව්‍ය පමණක් පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගයෙන් අඩු වටිනාකමකට අගය කර ඇත.

1.5 ලැබිය යුතු දේ

ලැබිය යුතු දෑ ඇස්තමේන්තු ගත උපලබ්ධි අගයට සටහන් කර ඇත.

1.6. වගකීම් සහ වෙන් කිරීම්

1.6.1 ජංගම වගකීම්

ජංගම වගකීම් යනු ඉල්ලුම මත හෝ ශේෂ පත්‍රයේ දින සිට වසරක් ඇතුළත ගෙවීම් සඳහා ගෙවිය යුතු ඒවා වේ. මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී දන්නා සියලුම වගකීම් ගිණුම්ගත කර ඇත.

1.7 ආදායම සහ වියදම්

1.7.1 ආදායම් හඳුනාගැනීම

පුහුණු වැඩසටහන සහ ප්‍රතීතන යෝජනා ක්‍රම වලින් ලැබෙන ආදායම උපචිත පදනම මත ගණනය කෙරේ. කෙසේ වෙතත්, ප්‍රතීතනය ලබා දීමෙන් පසු වසර තුනක කාලයක් සඳහා වාර්ෂික ප්‍රතීතන ගාස්තුව අය කරනු ලබන අතර වසර 03කට පෙර නැවත ඇගයීම සිදු කළ යුතුය. ප්‍රතීතන සහතිකය ප්‍රදානය කිරීමේදී 1 වන වසර සඳහා වාර්ෂික ගාස්තුවක් අය කරනු ලබන අතර ප්‍රදානය කළ වර්ෂය සඳහා ආදායම ලෙස සම්පූර්ණයෙන්ම සලකනු ලබන අතර 2 වන සහ 3 වන අලුත් කිරීම සඳහා එම පරිචය දිගටම කරගෙන යන්න.

ලැබීම් පදනම මත ආදායම් ප්‍රකාශයේ දීමනා හඳුනාගෙන ඇත.

1.7.2 භාණ්ඩාගාර පුදාන

මහා භාණ්ඩාගාරයෙන් ලැබෙන ප්‍රතිපාදන අදාළ කාලපරිච්ඡේදයේ හඳුනාගත් වියදම් වලට එරෙහිව ලැබෙන ආදායම් ලෙස හඳුනාගන්නා අතර ප්‍රාග්ධන ප්‍රතිපාදන වත්කම් අත්පත් කර ගැනීමේ විලම්බිත ආදායම් ලෙස අවත්කම් වල අගයට එකතුවීමක් ලෙස හඳුනාගැනේ.

1.7.3 වියදම් හඳුනාගැනීම

මණ්ඩලය පවත්වාගෙන යාමට සහ දේපල, කම්හල සහ උපකරණ කාර්යක්ෂමව පවත්වාගෙන යාමට දරන ලද සියලුම වියදම් ආදායම් ප්‍රකාශය වෙත අය කර ඇත.

1.8 බදු අය කිරීම

ආදායම් බදු සඳහා වෙන් කිරීම් සිදු කර නැත.

1.9 ශේෂ පත්‍ර දිනයෙන් පසු සිදුවීම්

ශේෂ පත්‍ර දිනයෙන් පසු මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීම හෝ ගැලපීම අවශ්‍ය වන සිදුවීම් කිසිවක් සිදු නොවීය.

1.10 සංසන්දනාත්මක සංඛ්‍යා

ප්‍රවර්තන වර්ෂය සහ සංසංදනාත්මක පෙර වර්ෂයේ සංඛ්‍යා දත්ත ඉදිරිපත් කර ඇත.

1.11 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මුදල් ප්‍රවාහ ප්‍රකාශය වක්‍ර ක්‍රම භාවිතා කර සකස් කර ඇත.

දේපල කම්හල සහ උපකරණ මිලදී ගැනීම සම්බන්ධ රජයේ ප්‍රදාන ආයෝජන මුදල් ප්‍රවාහ ලෙස වර්ග කෙරේ.

1.12 විදේශ විනිමය ඉපැයීම

වසර තුළ විදේශීය ප්‍රතීතන සේවා වලින් උපයා ඇති ආදායම නිෂ්පාදන සහතිකය මගින් USD 5,901.55 වේ. ආදායමේ රුපියලේ වටිනාකම රුපියල් 1,107,716.07 කි

1.13 විදේශ විනිමය ඉපැයීම් සඳහා ගිණුම්කරණය

විදේශ ගනුදෙනු සඳහා වෙනම FEEA ගිණුමක් පවත්වාගෙන යනු ලැබේ. ප්‍රොත්සෝමා ඉන්වොයිසියක් ඩොලර් හෝ යුරෝ ආකාරයෙන් FEEA වෙත ඉපැයීම් එකතු කිරීම සඳහා යවනු ලැබේ. එම තැන්පතු FEEA A/C එකතු කර මුදල් ප්‍රවාහ අවශ්‍යතාවයට අනුව ජංගම ගිණුමට මාරු කරනු ලැබේ. විදේශ විනිමය ගනුදෙනුවලින් ලැබෙන ලාභය හෝ අලාභය FEEA A/C සිට වත්මන් A/C දක්වා මුදල් ආපසු ගැනීමේදී හඳුනා ගැනේ.

1.14 පාරිතෝෂික දීමනාව

ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරීවරුන් විසින් හඳුන්වා දෙන ලද සූත්‍රයට අනුව පාරිතෝෂික ප්‍රතිපාදන සිදු කර ඇති අතර එය දැන් භාවිතා කිරීම නිර්දේෂ නොවන බැවින් එක් එක් සේවකයා විසින් සම්පූර්ණ කරන ලද මුළු වසර ගණන සැලකිල්ලට ගනිමින් අපි ප්‍රතිපාදන ගණනය කළෙමු. අපේක්ෂිත අවශ්‍යතා සහ අරමුදල් ලබා ගැනීමේ හැකියාව අනුව රාජ්‍ය බැංකුවක හෝ භාණ්ඩාගාර බිල්පත්වල ස්ථාවර තැන්පතු සඳහා අරමුදල් ආයෝජනය කෙරේ. පාරිතෝෂික දීමනා ලැබීමට හිමිකම් ඇති සියලුම සේවකයින් ආයෝජනයෙන් සම්පූර්ණයෙන්ම ආවරණය වේ.

1.15 තාක්ෂණික උපකරණ

පරිත්‍යාග ලෙස ලැබුණු සියලුම තාක්ෂණික උපකරණ ලැයිස්තුව සහ එම උපකරණවල විදේශීය මිල පහත පරිදි වේ.

1. සම්මත තාප යුවල EURO 3,860
2. සම්මත බර EURO 46,360
3. F1 බර කට්ටලය EURO 42,245

අනුකූලතා තක්සේරුව පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය

ගිණුම් සඳහා සටහන්

| | | සත්‍ය | සත්‍ය | අයවැය |
|---|---|---|---|---|
| | | **2020** | **2019** | **2020** |
| **1)** | **<u>ආදායම්</u>** | **(Rs.)** | **(Rs.)** | **(Rs.)** |
| | භාණ්ඩාගාර ලැබීම් (සටහන අංක 15) | 23,753,340.68 | 24,860,762.91 | 17,203,700.00 |
| | **<u>ප්‍රතීතන ආදායම</u>** | | | |
| | ප්‍රතීතන ආදායම් - පරීක්ෂණාගාර | 18,974,511.22 | 24,385,225.00 | 25,000,000.00 |
| | ප්‍රතීතන ආදායම් - ක්‍රමාංකනාගාර | 2,364,853.00 | 3,703,500.00 | 4,000,000.00 |
| | ප්‍රතීතන ආදායම් - වෛද්‍ය රසායනාගාර | 5,183,340.00 | 5,825,000.00 | 7,000,000.00 |
| | ප්‍රතීතන ආදායම් - පද්ධති සහතික කිරීම් | 3,732,100.00 | 3,926,792.25 | 6,000,000.00 |
| | ප්‍රතීතන ආදායම් - පුද්ගල සහතිකකිරීම් | 229,000.00 | 80,000.00 | 1,000,000.00 |
| | ප්‍රතීතන ආදායම් - නිමැවුම් සහතිකකිරීම් | 1,973,578.47 | 1,254,447.58 | 2,000,000.00 |
| | ප්‍රතීතන ආදායම් - (GHG) හරිතාගාර වායු | 827,000.00 | 829,000.00 | 1,750,000.00 |
| | ප්‍රතීතන ආදායම් - සෝදිසිකිරීම් ආයතන | - | - | - |
| | පරීක්ෂණ ආයතන ප්‍රතීතනයෙන් ලැබෙන ආදායම | 1,115,000.00 | 1,087,975.00 | 1,000,000.00 |
| | PT ප්‍රතීතනයෙන් ලැබෙන ආදායම | 366,000.00 | 579,000.00 | 250,000.00 |
